**<u>2022 මාර්තු මස 18 වන දින පැවැති ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව</u>**

**<u>කමිටු සාමාජිකයන්</u>**

1. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. දුමිඳු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ඩබ්.ජී.සී.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**<u>නොපැමිනිම</u>**

1. දුමිඳු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. ඩබ්.ජී.සී.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**<u>නිලධාරි</u>**

1. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
2. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
3. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
4. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
5. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
6. එරික් ප්‍රසන්න මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
7. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
8. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
9. රංජිත් හෙට්ටිආරච්චි මහතා - ක්‍රීඩා නිලධාරි
10. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
11. ඩී.එම්.අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
12. ඩී.එම්.අරුණ රන්දෙනිගම මහතා - ආරක්ෂක අධික්ෂණ
13. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**<u>නිලධාරි නොපැමිණිම</u>**

1. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
2. එරික් පි මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
3. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
4. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි

1. 2021.10.14 දින මහ සභාවේ (ක්‍රීඩා කමිටුව) යෝජනා අංක 2021/10-05-6-1 යටතේ අනුරාධපුර, තිසාවැව, තිස්ස මාවත, අංක:52, තිස්ස ක්‍රීඩා සමාජය විසින් ක්‍රීඩා කිරිමට සුදුසු වැව් රක්ෂිත ඉඩමක් පවතින බැවින් එම පිටිය මෙම ක්‍රීඩා සමාජය වෙත ක්‍රීඩා කිරිමට හැකි වන අයුරින් සකස් කර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීමට අනුව අනවසර නිලධාරින් එහි අයිතිය සනාථ කර ගත් තොරතුරු ඇතුලත් ලිපිය කමිටුව වෙත යොමු කිරිම.

   මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් අයිතිය නගර සභාවට ලබා දෙන ලෙස ඉල්ලීම් කර, ඉන්පසු නගර සභාව විසින් සංවර්ධනය කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

2. 2022.02.18 දින අංක 06 යටතේ කෝට්ටේ,මිරිහාන,රජමහා විහාර පාර,අංක:48/4,ශ්‍රී ලංකා සකල කලා සංසදය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් සකල කලා කරුවන්ගේ සුබ සාධන පුන්‍ය අරමුදලට බැතිබර අනුග්‍රාහක දායකත්වය ලබා දෙන ලෙස කල ඉල්ලීම.

   මෙම කමිටුවේ ප්‍රතිපාදන වෙන් කල හැක්කේ නගර සීමාවේ පමනක් බව තීරණය විය.

3. ගරු නාගරික මන්ත්‍රී එල්.ජී.ප්‍රේමචන්ද්‍ර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 319/බන්ඩාර පුලියන්කුලම ක්‍රීඩා පිටියේ ක්‍රිකට් ක්‍රීඩාව කරන අතර, එහි පන්දු යවන මංතීරුවක් නොමැති නිසා ක්‍රීඩා මංතීරුවක් සකස් කර දෙන මෙන් කර ඇති ඉල්ලීම.

   මෙම ඉල්ලීම ක්‍රීඩා නිලධාරිගේ අවධානයට යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

4. අනුරාධපුර,පණ්ඩුකාභය ක්‍රීඩාංගනය,තිනෙත් මලිඳු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 254 තුලාන පණ්ඩුකාභයපුර ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කිරිමට ඇතමුන්ගෙන් බාධා එල්ලවු බැවින් මෙම ක්‍රීඩා පිටියේ පෙර පරිදි ක්‍රීඩා කිරිමට අවසරය හා අධික්ෂණය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   ප්‍රදේශ වාසින්ගෙන් තොරව ක්‍රීඩා කරන්නේ නම් මහා නගර සභාවේ අවසරය ලබා ගතයුතුය. මේ සම්බන්ධව ගැටළුවක් ඇති බැවින් ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ හා අනෙකුත් අය සමග සාකච්ජා කර තීරණයක් ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

- අනුරාධපුර රටියල ජනසුව පදනම හා අනුරාධපුර මහා නගර සභාව එක්ව පැවැත්වෙන "ශ්‍රී සම්බුද්ධ රශ්මි වෙසක් උදානය - 2022" වෙසක් උදානය අනුරාධපුර බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍ර උද්‍යානයේදී 2022 මැයි මස 15,16,17 හා 18 යන දිනයන් හී පැවැත්වෙන බැවින්, ඒ සඳහා අනුග්‍රහකත්වය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

- අනුරාධපුර, පොදු වෙළඳසැල් පෙදෙස, පන්සල පාර, ශ්‍රී සුගතාරාමය,විහාරාධිපති පූජ්‍ය ඇස්වත්තේ සුමනසිරි හිමි විසින් ලිපියක් ඉදිරිපත් කරමින් බුදු මැදුරෙහි වහළය ඉදිකරවා දෙන ලෙසත්, බුදු පිළිමය,දැගසවු පිළිම සහ චිත්‍රවල සායම් ආලේප කිරීම ද සිදු කර දෙන මෙන් කර ඇති ඉල්ලීමට ගරු නගරාධිපතිතුමා විසින් රු.50,000.00 ක් වටිනා තින්ත ලබාදීමට නිර්දේශ කර ඇති ලිපිය කමිටුව වෙත යොමු කිරීම.

ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.